Ministry of Social Affairs and Employment

# මූලික සිවිල් ඒකාබද්ධතා විදේශීය පරීක්ෂණය

## නෙදර්ලන්තය වෙත

ඔබට ඔබගේ සහකරු සමග නෙදර්ලන්තයට යාමට අවශ්‍යයි. එසේනම්, ඔබ නෙදර්ලන්තයට යාමට පෙර මූලික සිවිල් ඒකාබද්ධතා විදේශීය පරීක්ෂණය විභාගය (කෙටි නම: මූලික සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය) සමත් විය යුතුය. ඔබට මූලික සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය පිළිබඳව සියලු විස්තර මෙම පත්‍රිකාවෙන් කියවිය හැකිය.

## නෙදර්ලන්තයෙහි ඒකාබද්ධ වීම

ඔබට නෙදර්ලන්තයේ ජීවත් වීමට අවශ්‍යනම්, ඔබ පහත සඳහන් දෑ කළ යුතුය:

- ඔබ ලන්දේසි භාෂාව ඉගෙන ගත යුතුය. මෙය ඔබට නෙදර්ලන්තයේදී ඔබේ කටයුතු කරගෙන යාම පහසු කරවනු ඇති.
- ඔබ නෙදර්ලන්තය කුමන අකාරයක රටක්දැයි යන්න සහ අප කුමන ආකාරයකට එකිනෙකා සමග කටයුතු කරනවාද යන්න ඉගෙන ගත යුතුය.
- ඔබ සමාජය සමග මිශ්‍ර විය යුතුය. උදාහරණයක් වශයෙන්, රැකියාවක නිරත වීමට හෝ ස්වේච්ඡා සේවයේ යෙදීමට, එසේත් නොමැතිනම් ඔබට පුහුණු පාඨමාලාවක් සඳහා සහභාගී වීමට හෝ සරලවම අසල්වැසියන් සමග සබඳතා පවත්වා ගැනීමට සිදු වේ. අපි මෙය, “ඒකාබද්ධතාව” හෝ “සිවිල් ඒකාබද්ධතාවය” ලෙස හඳුන්වමු.

## ඔබත් සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුද?

ඔබ සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය සඳහා පෙනී සිටීම අනිවාර්යයද නැද්ද යන්න ඔබගේ වයස හෝ ජාතිකත්වය යන කරුණු මත රඳා පවතී.
ඔබ සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය සඳහා පෙනී සිටීම අනිවාර්යයද යන්න දැන ගැනීම සඳහා ආගමන සහ ස්වාභාවිකකරණ සේවා (IND) වෙබ් අඩවිය බලන්න.
ඔබට ඒ සඳහා ආගමන සහ ස්වාභාවිකකරණ සේවය දුරකථනයෙන්ද ඇමතිය හැකිය.(IND)
දුරකතනය: 088 - 0430 430 (දේශීය)
විදේශයක සිට: +31 88 0430 430

## ඔබට සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට නොහැකි නම්?

සමහර පුද්ගලයන්ට ඔවුන්ගේ සෞඛ්‍යය වැනි හේතු නිසා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට නොහැකිය.
ඔබත් පරීක්ෂණයට පෙනී සිටිය යුතුදැයි දැනගැනීමට අවශ්‍යද? එසේ නම්: www.rijksoverheid.nl/onderwerpen/nieuw-in-nederland/vraag-en-antwoord/kan-ik-ontheffing-krijgen-voor-een-inburgeringsexamen.html වෙත පිවිසෙන්න.

## විදේශයකදී සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය සමත් වීම

යුරෝපා සංගමයෙන් පිටත පුද්ගලයින්ට නෙදර්ලන්තයේ ජීවත් වීමට අවසර ලැබීම සඳහා සාමාන්‍යයෙන් බලපත්‍රයක් අවශ්‍යය. මෙම බලපත්‍රය ලබා ගැනීම සඳහා, ඔබ පළමුව සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය විදේශයකදී සමත් විය යුතුය.

## සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය කුමන ආකෘතියක් ගනීද?

මෙම පරීක්ෂණය කොටස් 3කින් සමන්විතය:

1. කථනයේ ප්‍රවීණතාවය - ඔබට ලන්දේසි භාෂාව කතා කළ හැකි විය යුතුය.
2. කියවීමේ ප්‍රවීණතාවය - ඔබට ලන්දේසි භාෂාව කියවිය හැකි විය යුතුය.
3. ලන්දේසි සමාජය පිළිබඳව දැනුම - අප නෙදර්ලන්තයේදී එකිනෙකා සමග ගණුදෙනු කරන ආකාරය ඔබ දැන ගත යුතුය. එසේම නෙදර්ලන්තයේ නීති රීතිද ඔබ දැන ගත යුතුය.

පරීක්ෂණය පිළිබඳව තවත් තොරතුරු www.naarnederland.nl හිදී ලබා ගත හැක.

## මූලික සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය සඳහා සූදානම් වීම

ඔබට මූලික සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය සඳහා *“Naar Nederland”* නිල ස්වයං අධ්‍යයන කට්ටලය සමග සූදානම් විය හැකිය. පරීක්ෂණය සඳහා සූදානම් වීමට අවශ්‍ය කරන සියල්ල: කථනයේ ප්‍රවීණතාවය, කියවීමේ ප්‍රවීණතාවය සහ ලන්දේසි සමාජය පිළිබඳව දැනුම මෙම කට්ටලයේ අඩංගුය. ඔබට මෙය ගාස්තුවකින් තොරව බාගත කරගැනීමට හෝ www.naarnederland.nl වෙබ් අඩවියෙන් යූරෝ 25ක ගාස්තුවකට ඇණවුම් කිරීමට හැකිය.
මෙම කට්ටලය භාෂාවන් 33කින් ලබා ගත හැකිය.

වෙබ් අඩවියේ පුහුණු වීමට ආදර්ශ ප්‍රශ්න පත්‍රද අඩංගුය.

## ඔබට පරීක්ෂණයට මුහුණ දිය හැක්කේ කොතැනකදී ද?

- ලන්දේසි තානාපති කාර්යාලයකදී
- ලන්දේසි කොන්සල් කාර්යාලයකදී

ඔබ සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය සඳහා ලියාපදිංචි වන විට, ඔබේ රටේ තානාපති කාර්යාලයක් හෝ කොන්සල් කාර්යාලයක් තිබේද යන්න දැන ගත හැකිය. ඔබට සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවශ්‍ය රටේ තානාපති කාර්යාලයක් හෝ කොන්සල් කාර්යාලයක් නැති නම්, ඔබට ඒ සඳහා වෙනත් රටකට යෑමට සිදු වේ. ඔබ ලියාපදිංචි වන විට ඔබ පරීක්ෂණය සඳහා පෙනී සිටින්නේ කොහි දැයි ඔබට තෝරා ගත හැක.

## ලියාපදිංචි වන්නේ කෙසේද?

අයදුම්පත්රය පුරවන්න.
පරීක්ෂණයේ සියලුම කොටස් එකවර ලබා ගනීම සඳහා යූරෝ 150ක් වැයවේ. ඔබට වෙන් වෙන් වශයෙන්ද පරීක්ෂණයට පෙනී සිටිය හැක. කථනයේ ප්රවීණතාවය සඳහා යූරෝ 60ක් වැය වේ. කියවීමේ ප්රවීණතාවය සඳහා යූරෝ 50ක් වැය වේ. ලන්දේසි සමාජය පිළිබඳව දැනුම සඳහා යූරෝ 40ක් වැය වේ.

## ලියාපදිංචියෙන් පසු?

ඔබ සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය සඳහා ලියාපදිංචි වූ විට, ඔබට අධ්යාපන අමාත්යාංශයේ නියෝජිත ආයතනය - Dienst Uitvoering Onderwijs (DUO) වෙතින් විද්යුත් තැපැල් ලිපියක් ලැබෙනු ඇත. මෙය ඔබ ගෙවීම් කළ යුතු ආකාරය පැහැදිලි කරයි. DUO වෙත ඔබගේ ගෙවීම ලැබුණු විට, ඔබට DUO වෙතින් තවත් විද්යුත් තැපැල් ලිපියක් ලැබෙනු ඇත. ඔබට පරීක්ෂණයට පෙනී සිටීම සඳහා දිනයක් ලබා ගත හැකි බව ඒ මගින් දන්වනු ඇත. ඔබ තානාපති කාර්යාලයෙන් හෝ කොන්සල් කාර්යාලයෙන් ඒ සඳහා දිනයක් ලබා ගනියි.
ඔබ සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය පිළිබඳව තවත් විස්තර දැන ගැනීමට කැමතිද? එසේ නම්: www.naarnederland.nl වෙත පිවිසෙන්න.
ඔබට ප්රශ්න කිසිවක් තිබේද? එසේ නම්, දුරකථන අංක 1400 හරහා මධ්යම රජය අමතන්න.
ඔබ විදේශයක සිට අමතනවා නම්: + 31 77 4656767.
එසේම ඔබගේ විමසීම් www.rijksoverheid.nl හරහා ද සිදු කළ හැකිය.

## පරීක්ෂණ දිනයේ කුමක් සිදුවේද?

- ඔබ පෙර එකඟ වූ දිනයේ නියමිත වේලාවට පැමිණේ.
- ඔබට DUO වෙතින් ලැබුණු තහවුරු කිරීමද ඔබ පරීක්ෂණයට රැගෙන ආ යුතුය.
- ලන්දේසි අවශ්යතා සපුරන ගමන් බලපත්ර ප්රමාණයේ මෑතදී ගත් වර්ණ ඡායාරූපයක්ද ඔබ රැගෙන ආ යුතුය.
- පිළිගැනීමේ මේසය වෙත වාර්තා කරන්න.
- ඔබගේ ගමන් බලපත්රය ඉදිරිපත් කරන්න. වෙනත් අනන්යතාව ඔප්පු කිරීම්ද වලංගු වේ.
- සේවකයා එහි පිටපතක් ගනියි.
- ඔබගේ ඇඟිලි සළකුණු ලබා ගනු ඇති.
- ඔබගේ සියලු තොරතුරු පරිගණකයට ඇතුළත් කරනු ඇති.

## ඔබ පරීක්ෂණයේ සියලු කොටස් අඛණ්ඩව කරගෙන යනවා නම්, පරීක්ෂණය කුමන ආකෘතියක් ගනීද?

- ලන්දේසි සමාජය පිළිබඳව දැනුම කොටස පිළිබඳව පැහැදිලි කිරීම.
- ලන්දේසි සමාජය පිළිබඳව දැනුම කොටස සම්පූර්ණ කිරීම. මෙම පරීක්ෂණය සඳහා වන උපරිම කාලය මිනිත්තු 30යි.
- විවේකය.
- කියවීමේ ප්රවීණතාවය කොටස පිළිබඳව පැහැදිලි කිරීම.
- කියවීමේ ප්රවීණතාවය කොටස සම්පූර්ණ කිරීම. මෙම පරීක්ෂණය සඳහා වන උපරිම කාලය මිනිත්තු 35යි.
- විවේකය.
- කථනයේ ප්රවීණතාවය කොටස පිළිබඳව පැහැදිලි කිරීම.
- කථනයේ ප්රවීණතාවය කොටස සම්පූර්ණ කිරීම. මෙම පරීක්ෂණය සඳහා වන උපරිම කාලය මිනිත්තු 30යි.

ඔබ මෙම පරීක්ෂණය සඳහා පෙනී සිටින්නේ පරිගණකය ඇසුරෙනි. ඔබට කිසිවක් ලිවීමට සිදු නොවේ. මෙම සියල්ලටම ඔබට තානාපති කාර්යාලයේ හෝ කොන්සල් කාර්යාලයේ පැය 2ක පමණ කාලයක් රැඳී සිටීමට සිදුවේ.

## ඔබ පරීක්ෂණය සමත් වූ පසු?

ඔබ පරීක්ෂණයේ සියලුම කොටස් සඳහා සමත් වීමේ ලකුණ ලබා තිබේ නම්, ඔබ පරීක්ෂණය සමත් ය. ඔබ එක් එක් කොටස සමත් වී ඇත්දැයි වෙන් වශයෙන් දන්වනු ඇත. ඔබ පරීක්ෂණයේ යම් කොටසක් අසමත් වී ඇත්නම්, ඔබට එම කොටස සඳහා නැවත පෙනී සිටීමට සිදු වේ.

## ඔබ ප්රතිඵලය දැනගන්නේ කවදාද?

ඔබට DUO මගින් සති 8ක් තුළ ඔබගේ ප්රතිඵලය ලැබෙනු ඇත. නමුත් සාමාන්යයෙන් එය ඊට වඩා අඩු කාලයක් ගනී. ඔබ පරීක්ෂණයේ සියලු කොටස් සමත් වී ඇත්නම්, ඔබට ඔබගේ තාවකාලික පදිංචිය සඳහා වන බලපත්රය ලබා ගැනීමේ වැඩ කටයුතු ඉදිරියට කරගෙන යා හැකිය. තාවකාලික පදිංචිය සඳහා වන බලපත්රයක් ඉල්ලුම් කිරීමේදී අනුගත විය යුතු වෙනත් නීති රීතිද පවතී. මේ පිළිබඳ වැඩි විස්තර සඳහා: www.ind.nl වෙත පිවිසෙන්න. එසේම ඔබට දුරකතනයෙන් ඇමතිය හැක: 088 - 0430 430 (දේශීය)
ඔබ විදේශයක සිට අමතනවා නම්: +31 88 0430 430

## ඔබ පරීක්ෂණය සමත් වීමෙන් වසරක් ඇතුළත තාවකාලික පදිංචිය සඳහා වන බලපත්රයක් අයදුම් කළ යුතුය.

ඔබගේ නියමිත කාලය අවසන්ද? එසේ නම්, ඔබ නැවත පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අප කාලය ගණනය කරන්නේ ඔබ පරීක්ෂණයේ අවසන් කොටස සමත් වූ දිනයේ සිටයි.

## ඔබ පරීක්ෂණය අසමත් වුවහොත්?

ඔබට ඕනෑම වේලාවක නැවත පරීක්ෂණයට පෙනී සිටිය හැකිය. කෙසේ නමුත්, ඔබට නැවතත් මූලික සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය සඳහා ලියාපදිංචි වීමට සහ නැවත මුදල් ගෙවීමට සිදුවේ.

## ඔබට පරීක්ෂණය පිළිබඳව තවත් තොරතුරු දැන ගැනීමට අවශ්යද?

එසේ නම්, www.naarnederland.nl වෙත පිවිසෙන්න. ඔබට යම් කිසි ගැටලුවක් තිබේද? එසේනම්, දුරකථන අංක 1400 හරහා මධ්යම රජය අමතන්න.
ඔබ විදේශයක සිට අමතනවා නම්: + 31 77 4656767.
එසේම ඔබට විද්යුත් තැපැල් මාර්ගයෙන්ද විමසීම් සිදු කළ හැකිය. ඒ සඳහා, www.rijksoverheid.nl වෙත පිවිසෙන්න.

## නෙදර්ලන්තයෙහි ඒකාබද්ධ වීම

ඔබ නෙදර්ලන්තයේ ජීවත් වන විට, ඔබ ඒකාබද්ධ වීම නොකඩවාම කරගෙන යා යුතුය. මෙය ඔබට ලන්දේසි සමාජය සමඟ මුසු වීම පහසු කරන අතර රැකියාවක් සොයාගැනීමට වැඩි අවස්ථාවක් උදා කරයි. ඔබ සිවිල් ඒකාබද්ධතා පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුත්තේ එම නිසාය. ඔබට පරීක්ෂණය පිළිබඳව තවත් තොරතුරු දැන ගැනීමට අවශ්යද? එසේ නම්: www.inburgeren.nl වෙත පිවිසෙන්න.